# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2164/54 - 2020 පෙබරවාරි මස 27 වැනි බ්‍රහස්පතින්දා - 2020.02.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/1978(X)(අ)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25අ වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර උසස් අධ්‍යාපන, තාක්ෂණ සහ නවෝත්පාදන අමාත්‍ය ආචාර්ය බන්දුල ගුණවර්ධන වන මා විසින්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කර ඇති, ලියාපදිංචි අංක පී. බී. 4833 දරන සමාගමක් වන නැෂනල් ස්කූල් ඔෆ් බිස්නස් මැනේජ්මන්ට් ලිමිටඩ් ආයතනය සම්බන්ධයෙන් ඉහත කී පනතේ 70ඇ වගන්තිය යටතේ වාර්තාවක් ලබා ගැනීමෙන් පසුව, මෙම නියමය මගින්, මේ පනත යටතේ සාදන ලද සහ 2019 දෙසැම්බර් මස 30 වැනි දින අංක 2156/10 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමයේ II වන උපලේඛනය, මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති කොන්දේසිවලට යටත්ව, එහි I වන තීරයේ දැක්වෙන "මෙකාට්‍රොනික් ඉංජිනේරු පිළිබඳ විද්‍යාවේදී ඉංජිනේරු ගෞරව" යන සටහනට හා එහි II වන තීරයේ අනුරූප සටහනට ඉක්බිතිව ම, මෙහි II වන උපලේඛනයේ පිළිවෙලින් I වන සහ II වන තීරයන්හි නිශ්චිතව දක්වා ඇති සටහන් එකතු කිරීම මඟින් මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

ආචාර්ය බන්දුල ගුණවර්ධන,
උසස් අධ්‍යාපන, තාක්ෂණ සහ නවෝත්පාදන අමාත්‍ය.

2020 පෙබරවාරි මස 24 වැනි දින,
කොළඹ දී ය.

**I වන උපලේඛනය**

**කොන්දේසි**

1. නැෂනල් ස්කූල් ඔෆ් බිස්නස් මැනේජ්මන්ට් ලිමිටඩ් ආයතනය විසින්, මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධියට අදාළ උපාධි පාඨමාලාව සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමේ දී සංචාරක, සත්කාර සහ සිදුවීම් පිළිබඳ ව්‍යාපාර කළමනාකරණවේදී උපාධිය සඳහා -

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ වාණිජ්‍ය විෂයය ධාරාවෙන් සාමාන්‍ය සාමාර්ථ ('S') තුනක් (3) එකවර ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම ; හෝ

(ආ) නිශ්චිත බලධරයා විසින් පිළිගත් එයට ඇඳුනු පාඨමාලාවක් සමග අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ කවර හෝ විෂයය ධාරාවක් යටතේ සාමාන්‍ය සාමාර්ථ ('S') තුනක් (3) එකවර ලබා තිබීම,

යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකම්වලට අනුකූලව කටයුතු කළ යුතු ය.

2. නිශ්චිත බලධරයා විසින් පවත්වනු ලබන පස් අවුරුදු (5) ප්‍රතිසමාලෝචනයකට යටත්ව මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන උපාධිය පිරිනැමීම සඳහා නැෂනල් ස්කූල් ඔෆ් බිස්නස් මැනේජ්මන්ට් ලිමිටඩ් ආයතනය හඳුනාගනු ලැබේ.

1A - PG 4903 — 517 (2020/02)

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**II වන උපලේඛනය**

| *I* වන තීරය<br>උපාධිය | *II* වන තීරය<br>උපාධිය සඳහා වන උපාධි කෙටි යෙදුම |
|---|---|
| සංචාරක, සත්කාර සහ සිදුවීම් පිළිබඳ ව්‍යාපාර කළමනාකරණවේදී | බීබීඑම් (සංචාරක, සත්කාර සහ සිදුවීම්) |

03 - 509/1

---

එල්.ඩී.බී. 21/1978(X)(අ)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25අ වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර උසස් අධ්‍යාපන, තාක්ෂණ සහ නවෝත්පාදන අමාත්‍ය ආචාර්ය බන්දුල ගුණවර්ධන වන මා විසින්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කර ඇති, ලියාපදිංචි අංක පී. වී. 101137 දරන සමාගමක් වන එස්. එල්. ටී. කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය සම්බන්ධයෙන් ඉහත කී පනතේ 70ඇ වගන්තිය යටතේ වාර්තාවක් ලබා ගැනීමෙන් පසුව, මෙම නියමය මගින්, මේ පනත යටතේ සාදන ලද සහ 2020 ජනවාරි මස 06 වැනි දින අංක 2157/3 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ II වන උපලේඛනය, මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති කොන්දේසිවලට යටත්ව, එහි I වන තීරයේ දැක්වෙන ''කෘෂිකාර්මික තාක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී ගෞරව'' යන සටහනට හා එහි II වන තීරයේ අනුරූප සටහනට ඉක්බිතිව ම, මෙහි II වන උපලේඛනයේ පිළිවෙලින් I වන සහ II වන තීරයන්හි නිශ්චිතව දක්වා ඇති සටහන් එකතු කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

ආචාර්ය බන්දුල ගුණවර්ධන,
උසස් අධ්‍යාපන, තාක්ෂණ සහ නවෝත්පාදන අමාත්‍ය.

2020 පෙබරවාරි මස 24 වැනි දින,
කොළඹ දී ය.

**I වන උපලේඛනය**

***කොන්දේසි***

1. එස්. එල්. ටී කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය විසින්, මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධිවලට අදාළ උපාධි පාඨමාලා සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමේ දී -

(අ) පරිසර තාක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී ගෞරව උපාධිය සඳහා අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ භෞතික විද්‍යාව, ජීව විද්‍යාව හෝ තාක්ෂණය විෂයය ධාරාව යටතේ අනුමත විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථ ('S') තුනක් (3) එකවර ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකම්වලට අනුකූලව කටයුතු කළ යුතු ය.

(ආ) ජෛව පද්ධති ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය සඳහා අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ ජීව විද්‍යාව (ජීව විද්‍යාව, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව) හෝ භෞතික විද්‍යාව (සංයුක්ත ගණිතය, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව) විෂයය ධාරාව යටතේ අනුමත විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථ ('S') තුනක් (3) එකවර ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකම්වලට අනුකූලව කටයුතු කළ යුතු ය.

2. නිශ්චිත බලධරයා විසින් පවත්වනු ලබන පස් අවුරුදු (5) ප්‍රතිසමාලෝචනයකට යටත්ව මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන උපාධි පිරිනැමීම සඳහා එස්. එල්. ටී කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය හඳුනාගනු ලැබේ.

II වන උපලේඛනය

| *I* වන තීරය<br>උපාධිය | *II* වන තීරය<br>උපාධිය සඳහා වන කෙටි යෙදුම |
|---|---|
| පරිසර තාක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී ගෞරව | බී ටෙක් ගෞරව (පරිසර තාක්ෂණය) |
| ජෛව පද්ධති ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව | බීඑස්සී ගෞරව (ජෛව පද්ධති ඉංජිනේරු) |

03 - 509/2

---

එල්.ඩී.බී. 21/1978(X)(අ)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25අ වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර උසස් අධ්‍යාපන, තාක්ෂණ සහ නවෝත්පාදන අමාත්‍ය ආචාර්ය බන්දුල ගුණවර්ධන වන මා විසින්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කර ඇති, ලියාපදිංචි අංක පී. වී. 62877 දරන සමාගමක් වන හොරයිසන් කොලේජ් ඔෆ් බිස්නස් ඇන්ඩ් ටෙක්නොලොජි (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය සම්බන්ධයෙන් ඉහත කී පනතේ 70ඇ වගන්තිය යටතේ වාර්තාවක් ලබා ගැනීමෙන් පසුව, මෙම නියමය මගින්, මේ පනත යටතේ සාදන ලද සහ 2016 ජූලි මස 14 වැනි දින අංක 1975/47 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමය, පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

1. එකී නියමයේ (1) වන කොන්දේසියේ "අධ්‍යාපනවේදී උපාධි" යන වචන වෙනුවට "අධ්‍යාපනවේදී ගෞරව උපාධි" යන වචන ආදේශ කිරීමෙන් ;

2. එකී නියමයේ උපලේඛනය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන නව උපලේඛනය ආදේශ කිරීමෙන් :-

ආචාර්ය බන්දුල ගුණවර්ධන,
උසස් අධ්‍යාපන, තාක්ෂණ සහ නවෝත්පාදන අමාත්‍ය.

2020 පෙබරවාරි මස 24 වැනි දින,
කොළඹ දී ය.

**උපලේඛනය**

| *I* වන තීරය<br>උපාධිය | *II* වන තීරය<br>උපාධිය සඳහා වන කෙටි යෙදුම |
|---|---|
| අධ්‍යාපනවේදී ගෞරව | බීඑඩ් ගෞරව |
| තොරතුරු තාක්ෂණ විද්‍යාවේදී/තොරතුරු තාක්ෂණ විද්‍යාවේදී ගෞරව | බීඑස්සී අයිටී/බීඑස්සී ගෞරව (අයිටී) |

03 - 509/3

එල්.ඩී.බී. 21/1978(X)(අ)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25අ වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර උසස් අධ්‍යාපන, තාක්ෂණ සහ නවෝත්පාදන අමාත්‍ය ආචාර්ය බන්දුල ගුණවර්ධන වන මා විසින්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කරනු ලැබූ සමාගමක් වන ලියාපදිංචි අංක පී. වී. 66705 දරන කාට්සු - හයිලි ඇඩ්වාන්ස්ඩ් මෙඩිකල් ටෙක්නොලොජි ට්‍රේනින් සෙන්ටර් (ප්‍රයිවට්) ලිමිටඩ් (KIU) ආයතනය සම්බන්ධයෙන් ඉහත කී පනතේ 70ඇ වගන්තිය යටතේ වාර්තාවක් ලබා ගැනීමෙන් පසු, මෙම නියමය මගින්, එකී පනත යටතේ සාදනු ලැබූ සහ 2019 ජනවාරි මස 09 වැනි දින අංක 2105/31 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමයේ II වන උපලේඛනය, මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් කොන්දේසිවලට යටත්ව, එහි I වන තීරයේ දැක්වෙන "හෙද විද්‍යාපති" යන සටහනට හා එහි II වන තීරයේ අනුරූප සටහනට ඉක්බිතිව ම, මෙහි II වන උපලේඛනයේ පිළිවෙලින් I වන සහ II වන තීරයන්හි නිශ්චිතව දක්වා ඇති සටහන් එකතු කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

ආචාර්ය බන්දුල ගුණවර්ධන,
උසස් අධ්‍යාපන, තාක්ෂණ සහ නවෝත්පාදන අමාත්‍ය.

2020 පෙබරවාරි මස 24 වැනි දින,
කොළඹ දී ය.

**I වන උපලේඛනය**

***කොන්දේසි***

1. කාට්සු - හයිලි ඇඩ්වාන්ස්ඩ් මෙඩිකල් ටෙක්නොලොජි ට්‍රේනින් සෙන්ටර් (ප්‍රයිවට්) ලිමිටඩ් (KIU) ආයතනය විසින්, මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධියට අදාළ උපාධි පාඨමාලාව සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමේ දී, අධ්‍යයන ක්‍රියාකාරකම් සහ පර්යේෂණ සංරචක මගින් (SLQF 10 වන ස්ථරය වන) කළමනාකරණ උපාය මාර්ග පිළිබඳ ව්‍යාපාර කළමනාකරණපති උපාධි පාඨමාලාව සඳහා -

(අ) පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උසස් අධ්‍යාපන ආයතනයකින් අධ්‍යයන සම්භාර 30ක් ඇතුළත් ව්‍යාපාර පරිපාලනය, රාජ්‍ය පරිපාලනය, වාණිජ්‍යය, මානව සම්පත් කළමනාකරණය, අලෙවිකරණය, ගිණුම්කරණය, මූල්‍යය, වතු කළමනාකරණය සහ තක්සේරුකරණය, ව්‍යාපාර ආර්ථික විද්‍යාව, මෙහෙයුම් කළමනාකරණය, තොරතුරු පද්ධති කළමනාකරණය හෝ ආර්ථික විද්‍යාව පිළිබඳ ප්‍රථම උපාධියක් ලබා තිබීම ; හෝ

(ආ) ව්‍යාපාර පරිපාලනය, රාජ්‍ය පරිපාලනය, වාණිජ්‍යය, මානව සම්පත් කළමනාකරණය, අලෙවිකරණය, ගිණුම්කරණය, මූල්‍යය, වතු කළමනාකරණය සහ තක්සේරුකරණය, ව්‍යාපාර ආර්ථික විද්‍යාව, මෙහෙයුම් කළමනාකරණය, තොරතුරු පද්ධති කළමනාකරණය හෝ ආර්ථික විද්‍යාව පිළිබඳ SLQF 6 වන ස්ථරයේ හෝ ඊට ඉහළ සුදුසුකමක් ලබා තිබීම ; හෝ

(ඇ) SLQF 6 වන ස්ථරයට සමාන හෝ ඊට ඉහළ වෘත්තීය සුදුසුකමක් සහිත වීම ; හෝ

(ඈ) එම විශේෂඥ ක්ෂේත්‍රයට ඇතුළත් වීම සඳහා නිශ්චිත බලධරයා විසින් නිශ්චය කළ හැකි පරිදි, GPA අගය 0 - 4 පරිමාණයකින් අවම වශයෙන් 3 අගයක් සහිතව NVQ 7 වන මට්ටම සම්පූර්ණ කිරීම,

යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකමට අනුකූලව කටයුතු කළ යුතු ය.

2. නිශ්චිත බලධරයා විසින් පවත්වනු ලබන පස් අවුරුදු (5) ප්‍රතිසමාලෝචනයකට යටත්ව මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන උපාධිය පිරිනැමීම සඳහා කාට්සු - හයිලි ඇඩ්වාන්ස්ඩ් මෙඩිකල් ටෙක්නොලොජි ට්‍රේනින් සෙන්ටර් (ප්‍රයිවට්) ලිමිටඩ් (KIU) ආයතනය හඳුනාගනු ලැබේ.

**II වන උපලේඛනය**

| *I* වන තීරය<br>උපාධිය | *II* වන තීරය<br>උපාධිය සඳහා වන කෙටි යෙදුම |
|---|---|
| කළමනාකරණ උපායමාර්ග පිළිබඳ ව්‍යාපාර කළමනාකරණපති | එම්බීඒ (කළමනාකරණ උපාය මාර්ග) |

03 - 509/4

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.